ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
නීති අධ්‍යයන දෙපාර්තමේන්තුව
නීතිවේදී උපාධි පාඨමාලාව - 3 වන මට්ටම
අඛණ්ඩ ඇගයීම් පරීක්ෂණය II- 2022/2023
LLU3303- රෝම නීතිය
කාලය - පැය එකයි. (01)

---

දිනය - 2023.10.22 වේලාව - පෙ.ව. 09.30 - පෙ.ව. 10.30

---

මුලු ප්‍රශ්න සංඛ්‍යාව දෙක (02) යි.
එක් ප්‍රශ්නයකට පමණක් පිළිතුරු සපයන්න.
අපේක්ෂකයින්ගේ අපැහැදිලි අත්අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ.

01. 20 හැවිරිදි රෝමානු පුරවැසියෙකු වූ ක්ලීටස්, ධනවත් ව්‍යාපාරිකයෙකුගේ එකම දියණිය වූ එට්කා සමඟ විවාහ වීමට අපේක්ෂා කරයි. කෙසේ වුවද, ක්ලීටස් ගේ පවුල යුදෙව් ජාතික මූලයකින් පැවත එන බව දක්වමින්, එට්කාගේ පවුලේ පීතෘ මූලිකයා වූ බෲනෝ මෙම විවාහයට අවසර දීම ප්‍රතික්ෂේප කරයි. එම අවස්ථාවේ දී, විවාහ උත්සවයක් වෙනුවට තමා සමග වසරක කාලයක් සහවාසය සඳහා ක්ලීටස් විසින් එට්කාට ආරාධනා කරයි. කෙසේ වෙතත් බෲනෝගේ කැමැත්ත ලැබෙන තෙක් සිටීමට එට්කා තීරණය කරන අතර,වලංගු විවාහයකදී ***dos*** ලබාදිය යුතු වන්නේ කවුරුන් විසින් ද යන්න දැන ගැනීමට එට්කා අපේක්ෂා කරන්නීය.

රෝම නීතියට අනුව ඉහත අවස්ථාවන්හි නීතිමය ආනුෂංග පැහැදිලි කරමින් ක්ලීටස් ට සහ එට්කා ට උපදෙස් දෙන්න. (ලකුණු 20)

02. (අ) පුතුන් දෙදෙනෙකුගේ සහ එක් දියණියකගේ පියෙකු වූ රෝමානු පුරවැසි ෆීලික්ස් අන්තිම කැමති පත්‍රයක් සකස් කිරීමට අපේක්ෂා කරන අතර, වලංගු රෝමානු අන්තිම කැමති පත්‍රයක් සකස් කිරීම සඳහා සම්පූර්ණ කළයුතු අවශ්‍යතා මොනවාදැයි දැන ගැනීමට බලාපොරොත්තු වේ. ඒ අවස්ථාව වන විට, ෆීලික්ස්ගේ බිරිඳ වූ කැමිලා, ඔවුන්ගේ සිව්වන දරුවා ලැබීමේ අපේක්ෂාවෙන් සිටියා ය.

ෆීලික්ස් ට උපදෙස් දෙන්න. (ලකුණු 10)

(ආ) ටයිටස්, තම වහලා වූ සුල්ලා තමාගේ දේපලෙහි එකම උරුමකරු ලෙස නම් කරමින් අන්තිම කැමති පත්‍රයක් ලියයි. ඉන් වසරකට පසු ටයිටස් මරණයට පත් වේ. ඔහුගේ දරුවන් තිදෙනා වූ ජූලියා, ඇල්බා සහ මේවියස් පසුව දැනගන්නේ ඔවුන් සියළු දෙනාට ම දේපල උරුමය අහිමි කරන බව දැක්වෙන පොදු ප්‍රතිපාදනයක් එම අන්තිම කැමති පත්‍රය තුළ අන්තර්ගත ව ඇති බවයි.

ටයිටස් ගේ අන්තිම කැමති පත්‍රය සාර්ථකව අභියෝගයට ලක් කළ හැකි ද යන්න සහ අභියෝගය සාර්ථක වුවහොත් ඇතිවන ආනුෂංග පිළිබඳව විස්තර කරමින් ජූලියා, ඇල්බා සහ මේවියස් ට උපදෙස් දෙන්න. (ලකුණු 10)

(මුළු ලකුණු 10 + 10 = 20)

හිමිකම් ඇවිරිණි.